

# නාට්‍ය හා රංගකලාව

## 09 ශ්‍රේණිය

### 02 වන වාරය

**නිපුණතාව 2.0 : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.**
**නිපුණතා මට්ටම 2.5 : පෙළට උචිත වන සේ අනුෂාංගික කලා සැලසුම් කරයි.**

පෙළට උචිත ආනුෂංගික කලා සැලසුම් කරමු.

නාට්‍යයක් සාර්ථක කර ගැනීම සඳහා යොදා ගන්නා කලාවන් ආනුෂංගික කලාව වේ. සතර අභිනය අතරින් අනාර්ය අභිනයට ආනුෂංගික, නළු නිළියන් යන පිරිස හැරුණු විට ආනුෂංගික කලාවට අයත් ශිල්පීන් පිරිස වැදගත් මෙහෙයක් ඉටු කරති. නට්‍ය යනු සාමූහික කලාවක් මෙන් ම ශ්‍රව්‍ය දෘෂ්‍ය කලාවක් ද වේ.



- **ආනුශංගික අංග හඳුනා ගනිමු.**

# වේෂභූෂණ




- නාට්‍යයක චරිත සඳහා නිර්මාණය කරන ලබන ඇඳුම්, පැළඳුම්, ආභරණ ආදිය වේෂභූෂණ ලෙස හඳුන්වයි. මෙම වේෂභූෂණ නළුවාගේ බාහිර සමාරෝපය ටත් අභ්‍යන්තර සමාරෝපයටත් ඉතා වැදගත් ආනුෂාංගික අංගයකි.ප්‍රේක්ෂකයන් හට නාට්‍යයක චරිත හඳුනා ගැනීමටත්, රසවින්දනය හා විශ්වාසනීයත්වයක් ගොඩනැඟීමටත් වේෂභූෂණ වැදගත් වේ.

# වේශභූෂණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු

- නාට්‍ය ඉදිරිපත් කරන රංග ශෛලිය පිළිබඳ ව.
- පිටපතෙහි සඳහන් කාලය දේශය යුගය පිළිබඳව
- නළු නිළියන්ට පහසුවෙන් දරා සිටිය හැකි ලෙස නිර්මාණය කිරීම
- නළු නිළියන් ට තම රංගනයට අපහසුවක් නොවන ලෙස නිර්මාණය කිරීම.
- පහසුවෙන් ඇඟ ලීමට සහ ගැලවීමට හැකි ලෙස නිර්මාණය කිරීම.
- වර්ණ සංයෝජනය පිළිබඳව සැලකිලිමත් වීම.

මෙවයින් ගිහින් බලන්නකෝ....තවත් අදහස් ගන්න පුලුවන් වෙයි.

- HTTPS://WWW.GOOGLE.COM/SEARCH?Q=DRAMA+COSTUME+DESIGN&CLIENT=MS-ANDROID-HUAWEI-REV1&PRMD=IVN&SXSRF=ALEKK035DKJZB7AMLIFLPCIJ59L_VVK8IG:1620796898663&SOURCE=LNMS&TBM=ISCH&SA=X&VED=2AHUKEWJK7PB7SSPWAHXN4ZGGHVRSDW0Q_AUOAXOECAIQAQ&BIW=360&BIH=654

- HTTPS://YOUTU.BE/ISGZQLKJZYK

# අංගරචනය

***මුහුණ ප්‍රධාන කොටගෙන සිරුරෙහි සිදු කරනු ලබන වෙනස්කිරීම අංග රචනය ලෙස හැඳින්වේ.***



- අංග රචනය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වර්ග කර දක්වයි.

1. සරල අංග රචනය
2. චරිතාංග අංග රචනය

- නාට්‍යයක් සඳහා අංග රචනය ආකාර කීපයකින් වැදගත් වෙයි.

1. ප්‍රේක්ෂකයාට චරිත හඳුනා ගැනීමට උපකාරී වීම.
2. චරිත පිළිබඳව නළුවා තුළත් ප්‍රේක්ෂකයා තුළත් තුළත් විශ්වසනීයත්වයක් ගොඩනැගීමට හැකි වීම.
3. නළුවා හට සමාරෝපය සඳහා සහය වීම.
4. ආලෝකකරණ තත කරන තත්ත්වයන් යටතේ යටපත් විය හැකියි මුහුණේ හැඩතල ඉරියව් හා ත්‍රිමාණ ලක්ෂණ මතු කර දැක්වීම.

# අංග රචනා ද්‍රව්‍ය කිහිපයක්.

- පෑන් කේක්
- LINING COLOURS
- ක්‍රේප් හෙයාර්
- ටූත් එනමල්
- ලිප්ස්ටික්
- කාජල්
- ස්ප්‍රීට් ගම්



















# අංග රචනා කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු.

- නළුවාගේ මුහුණේ සියුම් අංගයන්ට හානියක් නොවන ලෙස අංග රචනය සිදු කිරීම.
- වර්ණ සංයෝජනය පිළිබඳ පිළිබඳ සැලකිලිමත් වීම.
- නාට්‍ය ශෛලිය පිළිබඳව අවබෝධයෙන් යුතුව කටයුතු කිරීම.
- නාට්‍ය අයත් කාලය, දේශීය, යුගය  පිළිබඳව සැලකිලිමත් වීම.
- නළුවාගේ ශරීර වර්ණය පිළිබඳව සැලකිලිමත් වීම.

# මේ ලින්ක් වලින් ගිහින් තවත් තොරතුරු හොයාගන්න..

- HTTPS://WWW.GOOGLE.COM/SEARCH?Q=DRAMA+MAKEUP+DESIGN&CLIENT=MS-ANDROID-HUAWEI-REV1&HL=EN&PRMD=IVSN&SXSRF=ALEKK01IWE-_FV2D-KANUDRXRTCEQ0CKOA:1620797155725&SOURCE=LNMS&TBM=ISCH&SA=X&VED=2AHUKEWJW5-D1S8PWAHXYWZGGHFHYCGSQ_AUOAXOECAIQAQ&BIW=360&BIH=654&DPR=3
- HTTPS://YOUTU.BE/USE-AYMVDTU

# පසුතල නිර්මාණ



- නාට්‍ය අවස්ථාවන්ට උචිත පරිදි වේදිකාව සකස් කර තිබීම පසුතල නිර්මාණ ලෙස හැඳින්විය හැකිය.
- පසුතල නිර්මාණ නිර්මාණ කරණයේ දී නාට්‍ය ඉදිරිපත් කරන රංග ශෛලිය පිළිබඳව සැලකිලිමත් විය යුතුය
- බොහෝවිට පසුතල නිර්මාණ භාවිත කරනු ලබන්නේ ලෝක ධර්මී ශෛලිය ට අයත් නාට්‍යයන්හි දී ය.නාට්‍යධර්මී ශෛලියෙන් නාට්‍ය වල දී පසුතලය ඉදිරිපත් කරනු ලබන්නේ,

1. දෙබස් මගින්
2. ගීත මගින්

- වේදිකාවේ වටයක් යෑමෙන් ය
- පසුතල නිර්මාණ සංකේතාත්මකව මිනිස් සිරුර උපයෝගී කරගනිමින් ආලෝක උපක්‍රම යොදාගනි ගනිමින් හෝ විචිත්‍ර වස්ත්‍ර යොදා ගැනීම වැනි ක්‍රමවේදයන් භාවිත කරමින් ද වේදිකා නාට්‍ය සඳහා පසුතල නිර්මාණ කළ හැකි ය.
- පසුතල නිර්මාණ මගින් සිදුවිය යුත්තේ නළුවා හා රූපණ කාර්ය ඉස්මතු කර දැක්වීමයි. එහි භාවිත වර්ණ, හැඩ තල ආදී නළුවා යටපත් වීම හෝ රූපණ කාර්යය ඉක්මවා පසුතල නිර්මාණ කෙරෙහි ප්‍රේක්ෂක අවධානය යොමු වීම සිදු නොවීමට වග බලා ගත යුතුය.මේ අය පසුතල නිර්මාණයේ දී විශේෂයෙන්ම විශේෂයෙන්ම සැලකිලිමත් විය යුතු කරුණක් ලෙස පෙන්වා පෙන්වා දිය හැකිය.

# පසුතල නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු .

- පහසුවෙන් හැසිරවිය හැකි වීම.
- පහසුවෙන් ගබඩා කළ හැකි වීම.
- පහසුවෙන් ප්‍රවාහනය කළ හැකි වීම.
- අඩු වියදමකින් උපරිම ප්‍රයෝජන ගත හැකි පරිදි පසුතල නිර්මාණය කිරීම.
- ශක්තිමත් ලෙස නිර්මාණය කිරීම.



# මෙතනින් ගිහින් බැලුවොත් තවත් ලස්සන නිර්මාණ බලාගන්න පුලුවන් …

- HTTPS://WWW.GOOGLE.COM/SEARCH?Q=DRAMA+SET+DESIGN&CLIENT=MS-ANDROID-HUAWEI-REV1&PRMD=IVSN&SXSRF=ALEKK01ENGHJX2T2ATN-G7WEWRLUICOJHA:1620796999297&SOURCE=LNMS&TBM=ISCH&SA=X&VED=2AHUKEWJDJZWRS8PWAHVEWJGGHQYUCMEQ_AUOAXOECAIQAQ&BIW=360&BIH=654&DPR=3

- HTTPS://YOUTU.BE/UVTRWX8_CKA

# නාට්‍ය උපකරණ

- නළු නිළියන් රංගනයේද දී භාවිත කරනු ලබන උපකරණ නාට්‍යෝපකරණ ලෙස හැඳින්වේ.
- සැබෑ ජීවිතයේ දී භාවිත කරන උපකරණ හා වේදිකා නාට්‍ය සඳහා භාවිත කරන උපකරණ අතර විශාල වෙනස්කම් දක්නට ලැබේ.
- නාට්‍යයක් සඳහා නිර්මාණය කරනු ලබන නාට්‍ය උපකරණ වේ නම් ඒවා නාට්‍ය හා අත්‍යන්තයෙන් ම සම්බන්ධ ඒවා විය යුතුය එනම් නාට්‍ය විකාශනයේ දී විකාශනයේදී කවර අවස්ථාවක හෝ එම උපකරණ කවර හෝ අවශ්‍යතාවයක් සඳහා භාවිත වියයුතුය.
- නමුත් නාට්‍ය උපකරණ භාවිත නොකරමින් අභිරූපන හෝ වෙනත් උපත් උපක්‍රම මගින් මේවා ප්‍රේක්ෂක මනසෙහි මවමින් රූපණය සිදු කරන අවස්ථා ද දක්නට ඇත.

# නාට්‍ය උපකරණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු ලෙස,

- සැහැල්ලු බව
- සරල බව
- නළු නිළියන්ට අපහසුවක් නොවන සේ නිර්මාණය කර තිබීම.
- ප්‍රවාහනයේ පහසුව.
- ශක්තිමත් බව.

# ආලෝකකරණය

- වේදිකාව මත ප්‍රතිනිර්මාණය වන රංගනය සඳහා යොදන ආලෝකය රංගාලෝකය ලෙස හඳුන්වයි තවත් තවත් සරල ලෙස මෙය හැඳින් වුව හොත් වේදිකාවේ අඳුර පළවා හැරීමයි. ප්‍රධාන වශයෙන් රංගාලෝක පහන් වර්ග දෙකක් දක්නට ලැබේ එනම්
  - යොමු පහන
  - ධාරාලෝක පහන






# රංගාලෝකකරණයේ ප්‍රයෝජන

- ජවනිකා වෙන් කිරීම.
- අවස්ථා තීව්‍ර කිරීම.
- භාෂාවක් ලෙස ක්‍රියා කිරීම.
- තත්වානුරූපී මායාව ඇති කිරීම.

තව විස්තර මෙතනින් ....

- HTTPS://WWW.GOOGLE.COM/SEARCH?Q=DRAMA+LIGHTING+DESIGN&TBM=ISCH&VED=2AHUKEWI9YNBDS8PWAHVLN0SFHEPNCWWQ2-CCEGQIABAC&OQ=DRAMA+LIGH&GS_LCP=CHJTB2JPBGUTZ3DZLXDPEI1PBWCQARGBMGIIADICCAAYAGGAMGIIADICCAA6BAGJECDQ30LYYXRG8X1OAHAAEACAAYUCIAHEGJIBBTAUOS43MAEAOAEBWAEB&SCLIENT=MOBILE-GWS-WIZ-IMG&EI=EMABYL2JKSU-RTOP6PUL4AY&BIH=654&BIW=360&CLIENT=MS-ANDROID-HUAWEI-REV1&PRMD=IVSN
- HTTPS://YOUTU.BE/WQMYSJHU5RU

# නාට්‍ය සංගීතය



- නාට්‍යයට අවශ්‍ය සංගීතය සහ රංග වින්‍යාසයන් නිර්මාණය කර ගැනීමට මෙම කලාවන් දෙකෙහි සහයෝගය ඉතා වැදගත් වේ. බොහෝවිට සංගීතය හා නර්තනය නාට්‍ය ධර්මී නාට්‍යවලදී වැඩා වශයෙන් භාවිත වේ.

වැඩි විස්තර මෙතනින්.....

HTTPS://YOUTU.BE/OSBQXDQOVAE

පැවරුම

අනුශාංගික අංග නිර්මාණය කිරීමේදී පොදුවේ සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද ?

# නිවිතිගල කලාපීය නාට්‍ය හා රංගකලා ගුරු එකමුතුවේ සැකසුමකි.